# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2022**
**2025 ජුනි**

**මානවශාස්ත්‍ර පීඨය**

## නාට්‍ය හා රංගකලාව

**(අධ්‍යයන වර්ෂ 2009 සිට 2016 දක්වා)**

**නාට්‍ය නිර්මාණය හා විචාරය DMAT – E3025**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. නාට්‍ය නිෂ්පාදන කාර්යයක දී රචකයා, අධ්‍යක්ෂවරයා සහ රූපණශිල්පියා යන නිර්මාණකරුවන්ගේ කාර්යභාරය කෙබඳුදැයි නිදසුන් ඇසුරින් විවරණය කරන්න.

02. පහත දැක්වෙන මාතෘකා අතරින් (02) දෙකක් පිළිබඳ විස්තර කරන්න.

    අ) නෝ නාට්‍ය කලාවේ රූපණය

    ආ) ස්ටැනිස්ලව්ස්කිගේ රූපණ විධික්‍රමය (Method Acting)

    ඇ) භාව, විභාව සහ ව්‍යභිචාරී භාව

    ඈ) බර්ටෝල් බ්‍රෙෂ්ට්ගේ එපික් නාට්‍යවල රූපණය (Epic Acting)

03. වේදිකා නාට්‍යයක වේදිකා කළමනාකරුගේ (Stage Manager) කාර්යභාරය විස්තර කරන්න.

04. රංගාලෝක උපකරණ හඳුන්වා දී, රංගාලෝකකරණය නාට්‍යය නිර්මාණයක අර්ථ නිරූපණය සඳහා දක්වන දායකත්වය පැහැදිලි කරන්න. මේ සඳහා මෑතකදී ඔබ නැරඹූ වේදිකා නාට්‍ය දෙකක් උදාහරණ වශයෙන් ගන්න.

05. නාට්‍ය නිෂ්පාදන කාර්යයක පසුතල නිර්මාණකරුගේ (Set Designer) කාර්යභාරය උදාහරණ දක්වමින් විස්තර කරන්න.

06. "අනුෂංගික අංගවල කාර්යභාරය විය යුත්තේ අවස්ථා උද්දීපනය කිරීම නොව අවස්ථා අර්ථකථනය කිරීමයි" මෙම ප්‍රකාශය නිදසුන් දක්වමින් සනාථ කරන්න.

07. සෞන්දර්යාත්මක නොවන ආකල්ප ප්‍රේක්ෂක රසවින්දනය කෙරෙහි ඇති කරන බලපෑම කෙබඳුදැයි නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

08. රස විඳීම සහ නාට්‍ය විචාරය කිරීම යන අංශ විෂයෙහි අවධානය දක්වමින් ඊඩිපස් රජ නාට්‍යයත් රත්නාවලී නාටිකාවත් අතර පවතින්නේ කවරාකාරයේ වෙනස්කම් දැයි පෙන්වා දෙන්න.

******************************